# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2471/68 - 2026 ජනවාරි මස 17 වැනි සෙනසුරාදා - 2026.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.-බී. 9/2025**

### 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත

1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 18 වන, 24 වන, 28 වන සහ 30 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 44 වන වගන්තියේ (ඌ) සහ (ඒ) ඡේද යටතේ ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

බිමල් නිරෝෂන් රත්නායක,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 ජනවාරි මස 16 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2026 අංක 1 දරන මගී සේවා අවසර පත්‍ර පැවරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. වලංගු මගී සේවා අවසර පත්‍රයක් වෙනත් තැනැත්තකු හෝ ආස්‍රිතයකු වෙත පැවරීමට අපේක්ෂා කරනු ලබන (මේ නියෝගවල "පැවරුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) අවසර පත්‍ර දරන්නකු විසින් -



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(අ) ඔහු (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 9 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කරන ලද අදාළ බස් රථයේ අයිතිකරු බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

(ආ) II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය ලේඛන සහ III වන උපලේඛනයේ 1 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තුව ද සමග I වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ඉල්ලුම්පතක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව මගී සේවා අවසර පත්‍රය පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබාගැනීම සඳහා, කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය;

(ඇ) (ආ) ඡේදය යටතේ ඉල්ලුම්පතක් ඉදිරිපත් කිරීමට පෙරාතුව, අදාළ මගී සේවා අවසර පත්‍රය යම් අධිකරණ නඩු කටයුත්තකින්, මහජන පැමිණිල්ලකින්, ආයතනික විමර්ශනයකින්, කොන්ත්‍රාත්තුවකින්, ගිවිසුමකින් හෝ වෙනත් යම් නෛතික බැඳීමකින් මුක්ත බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඈ) (ආ) ඡේදය යටතේ ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කිරීමට පෙරාතුව, මගී සේවා අවසර පත්‍රය සම්බන්ධයෙන් වන යම් ගාස්තු, ලොග්පොතෙහි ගාස්තු, පිවිසුම්පත්‍ර ගාස්තු, දඩ මුදල්, ණය මුදල් හෝ වෙනත් යම් ගෙවීම්, යම් හිඟයකින් තොරව නිසි පරිදි පියවා ඇති බවට තහවුරු කරනු ලැබිය යුතු ය;

(ඉ) එකී පැවරුම්කරු විසින් කොමිෂන් සභාව වෙත හෝ අන්‍යාකාරයකින් හෝ ඉදිරිපත් කරන ලද යම් ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රයක් අහෝසි හෝ අවලංගු කරනු ලැබිය යුතු ය;

(ඊ) කොමිෂන් සභාව විසින් (මේ නියෝගවල "පැවරුම්ලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) පැවරීම සිදුකළ යුතු තැනැත්තා වෙත මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කරන තෙක් අදාළ බස් රථය අඛණ්ඩව ධාවනය කළ යුතු ය; සහ

(උ) මගී සේවා අවසර පත්‍රයේ පැවරුම සිදු කළ විට, එකී අවසර පත්‍රයේ අයිතිය ඉල්ලා සිටීමට හිමිකමක් නොතිබිය යුතු ය.

3. (මේ නියෝගවල "පැවරුම්ලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) වලංගු මගී සේවා අවසර පත්‍රයක පැවරුම්ලාභියකුවීමට අදහස් කරනු ලබන යම් තැනැත්තකු විසින්, අදාළ බස් රථයේ සන්තකය ලබාගැනීමෙන් සහ (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 9 වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීමේ සහතිකය ලබාගැනීමෙන් සතියක් ඇතුළත, V වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අවශ්‍ය ලේඛන සහ III වන උපලේඛනයේ 2 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති ඉල්ලුම්පත්‍ර පරීක්ෂා කිරීමේ ගාස්තුව ද සමග IV වන උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ ඉල්ලුම්පතක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනිකව කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. පැවරුම්ලාභියා විසින් 3 වන නියෝගයේ සඳහන් ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමට පෙරාතුව ම වූ මාස හයක කාලසීමාවක් ආවරණය කරමින් රුපියල් මිලියන දෙකක ශේෂයක් පවත්වාගෙන යමින් සිටි බවට ඔහු විසින් සහතික කළ යුතු අතර, එකී අඛණ්ඩ මූල්‍ය ශක්‍යතාව තහවුරු කිරීමට පැවරුම්ලාභියා විසින් බැංකු ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

5. පනතේ 18 වන සහ 24 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාව විසින් පැවරුම්ලාභියා වෙත මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කිරීම හෝ ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම, 3 වන නියෝගයේ සඳහන් ඉල්ලුම්පත ලැබීමෙන් සති දෙකක් ඇතුළත හෝ කොමිෂන් සභාව විසින් දැනුම් දෙනු ලැබිය හැකි පරිදි යම් පසු දිනයක දී කරනු ලැබිය හැකි ය.

6. (අ) පුද්ගලයකුට හෝ සමාගමකට මගී සේවා අවසර පත්‍රය පවරන අවස්ථාවක දී; සහ

(ආ) ඥාතිත්වයක් හෝ සම්බන්ධතාවක් මත පැවරීම බලාත්මක කරන අවස්ථාවක දී,

3 වන උපලේඛනයේ පිළිවෙලින් 3 වන සහ 4 වන අයිතමයන්හි නිශ්චිතව දක්වා ඇති ගාස්තු ගෙවීමෙන් පසු මගී සේවා අවසර පත්‍රයක් ලබාගැනීම සඳහා පැවරුම්ලාභියාට හිමිකම් තිබිය යුතු ය.

7. පනතේ සහ අදාළ නියෝගවල විධිවිධානවලට අනුව සහ මගී සේවා අවසර පත්‍රයේ නියම සහ කොන්දේසිවලට සහ කොමිෂන් සභාව විසින් කලින් කලට සකස් කරනු ලබන ගමන්වාර සහ කාල සටහන්වලට අනුකූලව, එකී අවසරපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ධාවන මාර්ගයේ පමණක් අදාළ බස්රථය ධාවනය කිරීමට පැවරුම්ලාභියාට හිමිකම් තිබිය යුතුය.

8. යම් ධාවන මාර්ගයකට අදාළ මුළු අනුමත මගී සේවා අවසර පත්‍ර ගණන හතරක් හෝ හතරට වඩා වැඩි වන අවස්ථාවක දී, පැවරුම්ලාභියකුට එකී මුළු ගණනෙන් සියයට විසි පහක් නොඉක්මවන මගී සේවා අවසර පත්‍ර ගණනක් පමණක් දැරීමට හිමිකම් තිබිය යුතු ය.

9. කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍රය පැවරුම්ලාභියා වෙත ප්‍රදානය කරනු ලැබ ඇති අවස්ථාවක දී, පනතේ 30 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එකී අවසර පත්‍රය අලුත් කිරීම සඳහා III වන උපලේඛනයේ 5 වන අයිතමයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ද සමඟ කොමිෂන් සභාව වෙත ඉල්ලුම් කිරීමට පැවරුම්ලාභියාට හිමිකම් තිබිය යුතු ය.

10. කොමිෂන් සභාව විසින් ප්‍රදානය කරන ලද මගී සේවා අවසර පත්‍රය, කොමිෂන් සභාව විසින් එකී ප්‍රදානය සිදු කරන ලද දිනයේ සිට අවම වශයෙන් වසර දෙකක කාල සීමාවක් ඉක්ම යන තෙක්, පැවරුම්ලාභියා විසින් යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් වෙත පවරනු නොලැබිය යුතු ය.

11. මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනත අදහස් වේ;

"කොමිෂන් සභාව" යන්නෙන්, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික ගමනාගමන කොමිෂන් සභාව අදහස් වේ;

"ඉලෙක්ට්‍රොනික" යන්නට, 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මගින් එයට දී ඇති අර්ථය ම තිබිය යුතුය;

"සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(8) වන ව්‍යවස්ථාව යටතේ අර්ථ නිරූපණය කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු අදහස් වේ; සහ

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නෙන්, (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතේ 2 වන වගන්තියේ සඳහන් කරනු ලබන රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා අදහස් වේ.

## I වන උපලේඛනය

**[2 වන නියෝගයේ (ආ) ඡේදය]**

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

**මගී සේවා අවසර පත්‍රයක් පැවරීමට පූර්ව අනුමැතිය ලබාගැනීම සඳහා පැවරුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ඉල්ලුම්පත්‍රය**

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

| | |
|---|---|
| ඉල්ලුම්පත්‍ර අංකය | :................................ |
| ලදුපත් අංකය | :.............................. |

*සටහන :* 1. සෑම ඉල්ලුම්කරුවකු විසින් I වන කොටස යටතේ වන විස්තර සම්පූර්ණ කළ යුතු ය.

2. II වන, III වන සහ IV වන කොටස් අදාළ වන පරිදි සම්පූර්ණ කරන්න. එනම් -

(*අ*) පැවරුම්කරු පුද්ගලයකු වන අවස්ථාවක දී, II වන කොටස අදාළ වේ;

(*ආ*) පැවරුම්කරු සමාගමක් වන අවස්ථාවක දී, III වන කොටස අදාළ වේ; සහ

(*ඇ*) පැවරුම්කරු මරණකරුවකු වන අවස්ථාවක දී, IV වන කොටස අදාළ වේ.

3. සෑම ඉල්ලුම්පත්‍රයක්ම, දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරියේ දී අත්සන් කර, එකී දිවුරුම් කොමසාරිස්වරයා විසින් නිසි ලෙස සහතික කරනු ලැබිය යුතු ය.

## I වන කොටස

<u>පැවරුම්කරුගේ තොරතුරු</u>

1. බස් රථයේ ලියාපදිංචි අංකය: ........................................................................................................
2. ජා.ග.කො. අංකය: ........................................................................................................
3. ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (එන්.එෆ්.සී.) කාඩ්පත් අනුක්‍රමික අංකය: ..........................................................
4. පැවරුම්කරුගේ සම්පූර්ණ නම: ........................................................................................................
5. (1) පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................
   (2) පැවරුම්කරුගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය: ..........................................................................
6. පැවරුම්කරු ජීවත්වන්නේ ශ්‍රී ලංකාවේ ද විදේශගතව ද? ..........................................................................
7. පැවරුම්කරු මිය ගොස් තිබේ ද?: ........................................................................................................
8. පැවරුම්කරු සමාගමක් නම්,-
   (1) සමාගමේ නම: ........................................................................................................
   (2) සමාගමේ සංස්ථාගත අංකය: .......................................................................................... ; සහ
   (3) සමාගමේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය: ..........................................................................
9. සම්බන්ධ කරගැනීමේ විස්තර:
   (1) ලිපිනය :
      (අ) ස්ථිර ලිපිනය: ........................................................................................................
      (ආ) ලිපි එවිය යුතු ලිපිනය: ..........................................................................................
   (2) දුරකතන අංකය:
      ස්ථාවර: ..................................................  ජංගම: ......................................................
      වට්ස්ඇප් අංකය:..........................................
   (3) විද්‍යුත් තැපැල් ලිපිනය ........................................................................................................
   (4) ෆැක්ස් අංකය: ........................................................................................................
   (5) ඉහත දැ අතරින් මනාප සම්බන්ධ කරගැනීමේ මාධ්‍යය: ..........................................................................
10. (1) ධාවන මාර්ගය: ........................................................ සිට ........................................................ දක්වා
    (2) ධාවන මාර්ග අංකය: ........................................................................................................
11. සේවාව : සාමාන්‍ය/අර්ධ සුඛෝපභෝගී/සුඛෝපභෝගී/අධි සුඛෝපභෝගී*
12. මගී සේවා අවසර පත්‍රයේ වලංගු කාලසීමාව: ...................................... සිට .................................... දක්වා
13. මගී සේවා අවසර පත්‍රය පැවරීමේ හේතුව: ..........................................................................

<u>පැවරුම්ලාභියාගේ තොරතුරු</u>

14. පැවරුම්ලාභියාගේ සම්පූර්ණ නම: ........................................................................................................
15. (1) පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................
    (2) පැවරුම්ලාභියාගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය: ..........................................................................
16. පැවරුම්ලාභියා සමාගමක් නම්-
    (1) සමාගමේ නම: ........................................................................................................
    (2) සමාගමේ සංස්ථාගත අංකය: ..........................................................................................; සහ
    (3) සමාගමේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය: ..........................................................................
17. සම්බන්ධකර ගැනීමේ විස්තර : (1) ලිපිනය:
      (අ) ස්ථිර ලිපිනය : ........................................................................................................
      (ආ) ලිපි එවිය යුතු ලිපිනය : ..........................................................................................
   දිස්ත්‍රික්කය:.......................................  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ................................

(2) දුරකථන අංකය :

ස්ථාවර: .................................................. ජංගම: ....................................................

වට්ස්ඇප් අංකය:......................................

(3) විද්‍යුත් තැපැල් ලිපිනය: .......................................................................................................

(4) ෆැක්ස් අංකය: ...................................................................................................................

* 11 වන අයිතමයේ කාර්යය සඳහා-

(අ) "සාමාන්‍ය සේවාව" යන්නෙන්, අසුන්ගතව සහ සිටගෙන සිටින මගීන් ගෙනයාම සඳහා අවසර දෙනු ලබන, අනුමත ධාවන මාර්ගවල සිදු කරනු ලබන අවසරලත් බස් රථ සේවාවක් අදහස් වේ. මේ සේවාවට අයත් බස් රථ, මගීන් බස් රථයට නංවා ගැනීමේ සහ ඉන් බැසීමේ කාර්යය සඳහා අවසරලත් සහ නම් කරන ලද සාමාන්‍ය බස් නැවතුම්පලවල නවත්වනු ලැබිය යුතු අතර, මගීන්ගෙන් අයකරනු ලබන ගාස්තු, කොමිෂන් සභාව විසින් නිසි පරිදි අනුමත කරන ලද සම්මත ගාස්තු විය යුතුය;

(ආ) "අර්ධ-සුඛෝපභෝගී" සේවාව යන්නෙන්, අසුන්ගත මගීන් සඳහා පමණක් ඉඩ සලසන, අනුමත ධාවන මාර්ගවල සිදු කරනු ලබන අවසරලත් බස් රථ සේවාවක් අදහස් වේ. මේ සේවාවට අයත් බස් රථ, මගීන් බස් රථයට නංවා ගැනීමේ සහ ඉන් බැසීමේ කාර්යය සඳහා නම් කරන ලද සීමිත බස් නැවතුම්පළවල නවත්වනු ලැබිය යුතු අතර, සාමාන්‍ය ගාස්තුව මෙන් එකහමාර ගුණයක් දක්වා වූ ගාස්තුව, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සම්මත ගාස්තු විය යුතු ය;

(ඇ) "සුඛෝපභෝගී" සේවාව යන්නෙන්, අසුන්ගත මගීන් සඳහා පමණක් අවසර ලබාදෙනු ලබන, වායුසමීකරණය කරන ලද බස් රථ භාවිතයෙන් අනුමත ධාවන මාර්ගවල සිදු කරනු ලබන අවසරලත් බස් රථ සේවාවක් අදහස් වේ. සාමාන්‍ය ගාස්තුව මෙන් දෙගුණයක් නොඉක්ම වූ ගාස්තුව, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සම්මත ගාස්තු විය යුතු ය; සහ

(ඈ) "අධි සුඛෝපභෝගී" සේවාව යන්නෙන්, අසුන්ගත මගීන් සඳහා පමණක් අවසර ලබා දෙනු ලබන, වායු සමීකරණය කරන ලද බස් රථ භාවිතයෙන් අනුමත ධාවන මාර්ගවල සිදු කරනු ලබන අවසරලත් බස් රථ සේවාවක් අදහස් වේ. මේ සේවාව අයත් බස් රථ, සීරුමාරුකළ හැකි හාන්සිවන අසුන්වලින්, පා තබඩුවලින් සහ වායු අවලම්බන (බැලුන) පද්ධතියකින් සමන්විත වන අතර, සාමාන්‍ය ගාස්තුව මෙන් තුන් ගුණයක් නොඉක්ම වූ සහ අධිවේගී මාර්ගවල බස් රථය ධාවනය කිරීමේ දී සාමාන්‍ය ගාස්තුව මෙන් දෙක හමාර ගුණයක් වූ ගාස්තුව, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන පරිදි සම්මත ගාස්තු විය යුතුය.

## II වන කොටස

........................................................................ වන මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සහ මේ සමග අමුණා ඇති ලේඛන මාගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය හා නිවැරදි වන බවට මෙයින් සහතික කරනු ලබන අතර, (ජාතික හැඳුනුම්පත් අංක ............................ ............... දරන) .................................................................... වෙතට .......................................... සිට .... ...................................... දක්වා වන ධාවන මාර්ගයේ ධාවනය කිරීම සඳහා, ලියාපදිංචි අංක ............................... දරන බස් රථය සම්බන්ධයෙන් මා වෙත නිකුත් කරනු ලැබ ඇති ජා.ග.කො. අංක ........................................ දරන මගී සේවා අවසර පත්‍රය පැවරීම සඳහා කැමැත්ත මෙයින් ප්‍රකාශ කර සිටිමි. එකී මගී සේවා අවසර පත්‍රය වෙනත් පාර්ශ්වයක් වෙත පැවරූ පසු අවසර පත්‍රයට අදාළ යම් අයිතියකට ප්‍රතිලාභයකට හෝ හිමිකමකට හිමිකම් නොකියන බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.

| ............................................ | | ................................................ |
|---|---|---|
| දිනය | පැවරුම්කරුගේ වම් මහපට ඇඟිලි සලකුණ | පැවරුම්කරුගේ අත්සන |

*සාක්ෂිකරුවන්:* (1) සම්පූර්ණ නම: ............................................................................................................
ලිපිනය:........................................................................................................................
අත්සන:.........................................................................................................................
දිනය:..........................................................................................................................

(2) සම්පූර්ණ නම: ............................................................................................................
ලිපිනය:........................................................................................................................
අත්සන:.........................................................................................................................
දිනය:..........................................................................................................................

**III වන කොටස**

....................................................................... (සමාගමේ නම) නාමය දරන සමාගම වන අප විසින් ඉහත සපයා ඇති තොරතුරු සහ මේ සමග අමුණා ඇති ලේඛන අපගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය හා නිවැරදි වන බවට මෙයින් සහතික කරනු ලබන අතර, [(ජාතික හැඳුනුම්පත් (ජා.හැ.) .......................................... දරන] ....................................................................... වෙතට .......................................... සිට .......................................... දක්වා වන ධාවන මාර්ගයේ ධාවනය කිරීම සඳහා, ලියාපදිංචි අංක ..... ........................... දරන බස් රථය සම්බන්ධයෙන් අප සමාගම වෙත නිකුත් කරනු ලැබ ඇති ජා.ග.කො. අංක ................................ ..... දරන මගී සේවා අවසර පත්‍රය පැවරීම සඳහා කැමැත්ත මෙයින් ප්‍රකාශ කර සිටිමු. එකී මගී සේවා අවසර පත්‍රය වෙනත් පාර්ශ්වයක් වෙත පැවරූ පසු අවසර පත්‍රයට අදාළ අයිතියකට, ප්‍රතිලාභයකට හෝ හිමිකමකට හිමිකම් නොකියන බව මෙයින් ප්‍රකාශ කර සිටිමු.

(1) සමාගමේ බලයලත් නිලධරයා :

(*අ*) නම : ............................................................................................................
(*ආ*) තනතුර :........................................................................................................
(*ඇ*) ජාතික හැඳුනුම්පත් අංකය: ...................................................................................
(*ඈ*) අත්සන: ........................................................................................................

(2) සමාගමේ බලයලත් නිලධරයා :

(*අ*) නම : ............................................................................................................
(*ආ*) තනතුර :........................................................................................................
(*ඇ*) ජාතික හැඳුනුම්පත් අංකය: ...................................................................................
(*ඈ*) අත්සන: ........................................................................................................

...................................................... ......................................................
දිනය සමාගමේ නිල මුද්‍රාව

*සාක්ෂිකරුවන්:* (1) සම්පූර්ණ නම: ............................................................................................................
ලිපිනය:........................................................................................................................
අත්සන:.........................................................................................................................
දිනය:..........................................................................................................................

(2) සම්පූර්ණ නම: ............................................................................................................
ලිපිනය:........................................................................................................................
අත්සන:.........................................................................................................................
දිනය:..........................................................................................................................

**IV වන කොටස**

1. ඉල්ලුම්කරුට මියගිය පැවරුම්කරු සමඟ ඇති ඥාතීත්වය හෝ සම්බන්ධතාවය: .......................................................

2. පැවරීම බලාත්මක කිරීම නඩු තීන්දුවකට යටත්ව සිදු කරනු ලබන අවස්ථාවක දී, එකී නඩු තීන්දුවේ විස්තර :
   (1) අධිකරණයේ නම: ..........................................................................................................................
   (2) නඩු අංකය: ......................................................................................................................................
   (3) නඩු තීන්දුව ලබාදුන් දිනය: ............................................................................................ ..................
   (4) ඉල්ලුම්කරුගේ නමින් ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය ප්‍රදානය කර තිබේ ද යන වග: ............

........................................................................ වන මා විසින් ඉහත සපයා ඇති තොරතුරු මාගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරනු ලබන අතර, .......................................... සිට .......................................... දක්වා ධාවන මාර්ගයේ ධාවනය කිරීම සඳහා, ලියාපදිංචි අංක ............................... දරන බස් රථය සම්බන්ධයෙන් ............................................ (මියගිය පැවරුම්කරුගේ නම) වෙත නිකුත් කරනු ලැබ ඇති ජා.ග.කො. අංක ....................................... දරන මගී සේවා අවසර පත්‍රය මා වෙත පවරන මෙන් ඉල්ලා සිටිමි.

| ............................................. | [ ] | ............................................. |
|---|---|---|
| දිනය | පැවරුම්කරුගේ වම් මහපට ඇඟිලි සලකුණ | පැවරුම්කරුගේ අත්සන |

*සාක්ෂිකරුවන්:* (1) සම්පූර්ණ නම: ..............................................................................................
ලිපිනය:.............................................................................................................
අත්සන:.............................................................................................................
දිනය:...............................................................................................................

(2) සම්පූර්ණ නම: ..............................................................................................
ලිපිනය:.............................................................................................................
අත්සන:.............................................................................................................
දිනය:...............................................................................................................

<u>**දිවුරුම් කොමසාරිස්වරයාගේ තොරතුරු**</u>

1. සම්පූර්ණ නම: ...............................................................................................................................
2. ලිපිනය: ...........................................................................................................................................
3. දුරකථන අංකය: ................................................................................................................................
4. විද්‍යුත් තැපැල් ලිපිනය: .....................................................................................................................

ඉහත නම් සඳහන් පැවරුම්කරු/ඉල්ලුම්කරු ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ අත්සන/අත්සන් සහ වම් මහපට ඇඟිලි සලකුණ සහ සමාගමක් වන අවස්ථාවක දී අත්සන සහ නිල මුද්‍රාව වර්ෂ .......................... ක් වූ .................................. මස ...................... වන දින, ඉහත සඳහන් සාක්ෂිකරුවන් සහ මා ඉදිරිපිට දී තබන ලදී.

.........................................................
දිවුරුම් කොමසාරිස්

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

පැවරුම්කරු විසින් වලංගු මගී සේවා අවසර පත්‍රයක් දරනු ලබයි. පැවරුම්කරු විසින් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ඉතිරි කාලසීමාව සඳහා මගී සේවා අවසර පත්‍රය පවරනු ලැබිය හැකි ය.

☐ අනුමත කරන ලදී.
☐ ප්‍රතික්ෂේප කරන ලදී.

.........................................................................
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

**II වන උපලේඛනය**

**[2 වන නියෝගයේ (ආ) ඡේදය ]**

**මගී සේවා අවසර පත්‍රයක් පැවරීම සඳහා පැවරුම්කරු විසින් ඉල්ලුම්පත්‍රයට අමුණනු ලැබිය යුතු ලේඛන**

| *පැවරුම්කරු පුද්ගලයකු වන අවස්ථාවක දී පැවරුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්කරු සමාගමක් වන අවස්ථාවක දී පැවරුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්කරු මරණකරුවකු වන හෝ පැවරීම ඥාතීත්වයක්/සම්බන්ධතාවක් මත බලාත්මක කරන අවස්ථාවක දී ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* |
|---|---|---|
| 1. මගී සේවා අවසර පත්‍ර පොත, ලේබලය සහ ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (එන්.එෆ්.සී.) කාඩ්පත් | 1. මගී සේවා අවසර පත්‍රය | 1. මගී සේවා අවසර පත්‍ර පොත, ලේබලය සහ ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (එන්.එෆ්.සී.) කාඩ්පත් |
| 2. පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පත (ඡායා පිටපතක් සමඟ) | 2. සමාගමේ බලයලත් නිලධරයන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පත් | 2. මියගිය පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පත (ඡායා පිටපතක් සමඟ) |
| 3. මේ උපලේඛනයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දිවුරුම් ප්‍රකාශකයක් | 3. මේ උපලේඛනයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දිවුරුම් ප්‍රකාශයක් (නිලධරයන් දෙදෙනා විසින් වෙන්ව දිවුරුම් ප්‍රකාශ ලබාදිය යුතුය) | 3. මේ උපලේඛනයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දිවුරුම් ප්‍රකාශයක් |
| 4. පැවරුම්කරුගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් | 4. සමාගමේ බලයලත් නිලධරයන් දෙදෙනාගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් (එක් අයකුට එක බැගින්) | 4. මියගිය පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායාරූපය අපැහැදිලි නම්, මියගිය පැවරුම්කරුගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් |
| | 5. සමාගමේ සංස්ථාගත කිරීමේ සහතිකය (ඡායා පිටපතක් සමඟ) | 5. මියගිය පැවරුම්කරුගේ මරණ සහතිකයේ සහතික පිටපතක් |

| පැවරුම්කරු පුද්ගලයකු වන අවස්ථාවක දී පැවරුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන | පැවරුම්කරු සමාගමක් වන අවස්ථාවක දී පැවරුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන | පැවරුම්කරු මරණකරුවකු වන හෝ පැවරීම ඥාතීත්වයක්/සම්බන්ධතාවක් මත බලාත්මක කරන අවස්ථාවක දී ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන |
|---|---|---|
| | 6. සාංගමික ව්‍යවස්ථාවලිය | 6. මියගිය පැවරුම්කරු සමඟ පැවති ඥාතීත්වය/සම්බන්ධතාවය තහවුරු කෙරෙන ලේඛනවල සහතික පිටපත් (උප්පැන්න සහතිකය, විවාහ සහතිකය ආදිය) |
| | 7. මඟී සේවා අවසර පත්‍රය පැවරීමට අවසර ලබාදුන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය | 7. පැවරීම බලාත්මක කිරීමට විධානය කරනු ලබන නඩු තීන්දුවේ සහතික පිටපතක් සහ අධිකරණය විසින් ප්‍රදානය කරන ලද ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය |
| 5. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) | 8. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) | 8. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) |

*සටහන*:

1. පැවරුම්කරු විසින් කොමිෂන් සභාව වෙත ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් දැනටමත් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක දී, එකී ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීමේ හෝ අවලංගු කිරීමේ මුල් පිටපත සමඟ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ වෙළුම් සහ පත්ඉරුවල සහතික පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

2. පැවරුම්කරු විදේශගතව සිටින අවස්ථාවක දී, එම රටේ දී ලියා අත්සන් කරන ලද සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත සමඟ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ වෙළුම් සහ පත්ඉරුවල සහතික පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

**II වන උපලේඛනයේ ඇමුණුම**

**දිවුරුම් ප්‍රකාශය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................................................ ලිපිනයේ පදිංචි ................................. ජාතික හැඳුනුම්පත් අංක ........................................ දරන ..................................................... (සම්පූර්ණ නම) වන මම ........................................................(සමාගමේ නම) නාමය දරන සමාගම වන අපි, ........................................ (බෞද්ධ/හින්දු/ඉස්ලාම්/ ක්‍රිස්තියානි) ආගමිකයකු/ලබ්ධිකයකු වශයෙන් ගම්භීර පූර්වකව ද, අවංකව ද සත්‍ය ලෙස ද පහත දැක්වෙන පරිදි මෙයින් .................................... (දිවුරුම් දී/ප්‍රකාශකර) ප්‍රතිඥා දෙමි/දෙමු.

1. මම/අපි ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක/ප්‍රකාශකයන් වෙමි/වෙමු.

2. I වන උපලේඛනයේ සඳහන් මඟී සේවා අවසර පත්‍රය, යම් නඩු කටයුත්තකින්, මහජන පැමිණිල්ලකින්, ආයතනික විමර්ශනයකින්, කොන්ත්‍රාත්තුවකින්, ගිවිසුමකින් හෝ වෙනත් යම් නීතිමය බැඳීමකින් මුක්ත බව මම/අපි මෙයින් ............................................... (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

3. මගී සේවා අවසර පත්‍රය සම්බන්ධයෙන් වන යම් ගාස්තු, ලොග්පත්‍ර ගාස්තු, පිවිසුම්පත්‍ර ගාස්තු, දඩ මුදල්, ණය හෝ වෙනත් යම් ගෙවීම් හිඟයකින් තොරව නිසි පරිදි පියවා ඇති බවට මම/අපි මෙයින් .................................... (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

4. .................................................. (බස් රථයේ ලියාපදිංචි අංකය) සම්බන්ධයෙන් යම් බලයලත් තැනැත්තකු හෝ පළාත් අධිකාරියක් විසින් වෙනත් මගී සේවා අවසර පත්‍රයක් නිකුත් කර නොමැති බවට මම/අපි මෙයින් ......................................... ......... (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

5. කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍රය පැවරුම්ලාභියා වෙත ප්‍රදානය කරනු ලබන තෙක් ඉහත සඳහන් බස් රථය අඛණ්ඩව ධාවනය කරන බවට මම/අපි මෙයින් ............................................. (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

6. මේ ඉල්ලුම්පත්‍රය සමඟ යම් ව්‍යාජ ලේඛනයක් හෝ අසත්‍ය තොරතුරු ඉදිරිපත්කර නොමැති බවට මම/අපි මෙයින් ............... .................................... (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

7. I වන උපලේඛනයේ සඳහන් මගී සේවා අවසර පත්‍රය කොමිෂන් සභාව විසින් පැවරුම්ලාභියා වෙත ප්‍රදානය කිරීමෙන් පසුව මම/අපි එකී අවසර පත්‍රයේ අයිතියට හිමිකම් නොකියන බවට මම/අපි මෙයින් ............................................. (දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

8. I වන උපලේඛනයේ සඳහන් මගී සේවා අවසර පත්‍රය පැවරීම සම්බන්ධයෙන් වන ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ යම් තීරණයක් මම/අපි පිළිගනු ලබන බවට මම/අපි මෙයින් තවදුරටත් .............................................(දිවුරුම් දී/ප්‍රකාශකර) සිටිමි/සිටිමු.

| | |
|---|---|
| ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය, ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක/ප්‍රකාශකයන් වෙත නිසි පරිදි කියවා තේරුම් කර දීමෙන් අනතුරුව, ඔහු/ඇය/ඔවුන් විසින් එහි අන්තර්ගතය තේරුම්ගෙන ප්‍රතිඥා දී මා ඉදිරිපිට දී වර්ෂ ............ ක් වූ ................ මස ............... වන දින ....................... දී ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ අත්සන තබන ලදී. | (අත්සන/අත්සන සහ සමාගමේ නිල මුද්‍රාව) |

දිවුරුම් ප්‍රකාශක

මා ඉදිරිපිට දී ය

...........................................
දිවුරුම් කොමසාරිස්

**III වන උපලේඛනය**

**[2 වන නියෝගයේ (ආ) ඡේදය සහ 6 වන නියෝගය]**

**ගාස්තු**

| *අංකය* | *විස්තර* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 1. | වලංගු මගී සේවා අවසර පත්‍රයක් පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබාගැනීම | 5,000.00 |
| 2. | වලංගු මගීසේවා අවසර පත්‍රයක් පැවරීම සඳහාවන ඉල්ලුම්පත | 5,000.00 |
| 3. | පුද්ගලයෙකු හෝ සමාගමක් වෙත මගී සේවා අවසර පත්‍රයක් පැවරීම | 300,000.00 |
| 4. | හිමිකමක් ඇති වෙනත් පාර්ශ්වයක් වෙත මගී සේවා අවසර පත්‍රයක් පැවරීම (මගී සේවා අවසර පත්‍රය දරන්නා මිය ගිය අවස්ථාවක දී සහ ඥාතිත්වයක්/සම්බන්ධතාවයක් මත පැවරීම බලාත්මක වන අවස්ථාවක දී) | 25,000.00 |

| *අංකය* | *විස්තර* | *ගාස්තුව (රු.)* |
|---|---|---|
| 5. | ප්‍රතිශෝධිත අයිතිය සමඟ මගී සේවා අවසර පත්‍රය වාර්ෂිකව අලුත් කිරීම (තාක්ෂණික අගය* මත පදනම්ව අලුත් කිරීමේ ගාස්තු ගෙවනු ලබන මගී සේවා අවසර පත්‍ර දරන්නන්ට මෙය අදාළ නොවිය යුතු ය) | 25,000.00 |

* 5 වන අයිතමයේ කාර්යය සඳහා-

"තාක්ෂණික අගය" යන්නෙන්, කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ක්‍රමවේදයට අනුකූලව, යම් නිශ්චිත ප්‍රතිශතයක් රජයේ ආදායම හෝ ආදායම් කොටසක් වශයෙන් රැස් කරගනු ලැබිය යුතු, අනුමත ආසන ධාරිතාව, භාර සාධකය, ධාවනය කරනු ලබන වාර ගණන, අදාළ ධාවන මාර්ග ගාස්තුව සහ වසරකට ධාවනය කරනු ලබන දින ගණන ඇතුළුව තාක්ෂණික සහ මෙහෙයුම් විචල්‍ය මත පදනම්ව ගණනය කරනු ලබන, නිශ්චිත ධාවන මාර්ගයකට අදාළ පර්යන්ත අගය අදහස් වේ.

## IV වන උපලේඛනය

**[3 වන නියෝගය]**

**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

**මගී සේවා අවසර පත්‍රයක් පැවරීම සඳහා පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත**

*සටහන* :
1. සෑම ඉල්ලුම්කරුවකු විසින් ම අමුණන ලද දිවුරුම් ප්‍රකාශය සමඟ I වන කොටස යටතේ වන විස්තර සම්පූර්ණ කළ යුතු ය.
2. පැවරුම්ලාභියා පුද්ගලයකු වන අවස්ථාවක දී, II වන කොටස අදාළ වේ;
3. පැවරුම්ලාභියා සමාගමක් වන අවස්ථාවක දී, III වන කොටස අදාළ වේ;
4. ඉල්ලුම්පත දිවුරුම් කොමසාරිස්වරයකු ඉදිරිපිට දී අත්සන් කළ යුතු අතර, එකී දිවුරුම් කොමසාරිස්වරයා විසින් එය නිසි පරිදි සහතික කළ යුතු ය.

(ටෙන්ඩර් කාර්යපටිපාටිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර සඳහා පමණි)

1. ලංසු අයදුම්පත් අංකය :
   (1) ලංසු මිල :
   (2) ලදුපත් අංකය :
   (3) දිනය :

## I වන කොටස

<u>පැවරුම්ලාභියාගේ තොරතුරු</u>

2. (1) (අ) පැවරුම්ලාභියාගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........
   (ආ) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........
   (2) (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........
   (ආ) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........
   (3) උප්පැන්න සහතිකයේ නම : ..........
   (4) විවාහ සහතිකයේ නම : ..........

* ඉහත නිශ්චිතව දක්වා ඇති ලේඛනවල නමෙහි වෙනසක් ඇති විට, පැවරුම්ලාභියා විසින්, එම වෙනස් නම් එක ම තැනැත්තෙකුට අයත් වන බව තහවුරු කිරීම සඳහා දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු ය.

3. (1) පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
(2) පැවරුම්ලාභියාගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ..........................................................

4. පැවරුම්ලාභියා සමාගමක් වන්නේ නම් :-
(1) සමාගමේ නම: ..........................................................
(2) සමාගමේ සංස්ථාගත අංකය : ..........................................................; සහ
(3) සමාගමේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ..........................................................

5. සම්බන්ධ කරගැනීමේ විස්තර :
(1) ලිපිනය:
(අ) ස්ථිර ලිපිනය : ..........................................................
(ආ) ලිපි එවිය යුතු ලිපිනය : ..........................................................

(2) දුරකතන අංකය:
ස්ථාවර : .......................................... ජංගම : ..........................................
වට්ස්ඇප් අංකය : ..........................................

(3) ෆැක්ස් අංකය:..........................................................

(4) විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................................

(5) ඉහත දෑ අතරින් මනාප සම්බන්ධ කරගැනීමේ මාධ්‍යය : ..........................................................

6. (අ) පළාත : .......................................... (ආ) දිස්ත්‍රික්කය : ..........................................
(ඇ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..........................................................
(ඈ) පොලිස් වසම : ..........................................................

පැවරුම්කරුගේ තොරතුරු

7. පැවරුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................

8. (1) පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය : ..........................................................
(2) පැවරුම්කරුගේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ..........................................................

9. පැවරුම්කරු සමාගමක් වන්නේ නම් : -
(1) සමාගමේ නම: ..........................................................
(2) සමාගමේ සංස්ථාගත අංකය : ..........................................................; සහ
(3) සමාගමේ බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය : ..........................................................

බස්රථය පිළිබඳ විස්තර

10. (1) බස් රථයේ ලියාපදිංචි අංකය : ..........................................................
(2) (අ) ජා.ග.කො. අංකය : ..........................................................
(ආ) ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (එන්.එෆ්.සී.) කාඩ්පත් අනුක්‍රමික අංකය : ..........................................................
(3) ලියාපදිංචි කිරීමේ සහතිකයේ දක්වා ඇති පරිදි බස් රථයේ ආසන ගණන : ..........................................................
(4) බස් රථයේ දොරවල් ගණන : ..........................................................
(5) නිෂ්පාදිත වර්ෂය : ..........................................................
(6) ලියාපදිංචි කළ දිනය : ..........................................................
(7) ආදායම් බලපත්‍රයේ සහ වායු විමෝචන සහතිකයේ අංකය සහ වලංගු කාල සීමාව : ..........................................................
(8) වැසියේ අංකය : ..........................................................

(9) එන්ජින් අංකය : ..............................

(10) වර්ගය : ..............................

(11) මාදිලිය : ..............................

(12) බස්රථයේ සන්තකය ලබාගත් දිනය : ..............................

(13) බස් රථයේ යෝග්‍යතා සහතිකය : ..............................
(අ) අනුක්‍රමික අංකය : ..............................
(ආ) දිනය : ..............................
(ඇ) ගරාජයේ නම : ..............................
(ඈ) ගරාජයේ ලියාපදිංචි අංකය : ..............................

(14) රක්ෂණාවරණය : ..............................
(අ) රක්ෂණ සමාගමේ නම : ..............................
(ආ) රක්ෂණ සහතික අංකය : ..............................
(ඇ) කල් ඉකුත් වීමේ දිනය : ..............................

(15) මූල්‍ය පහසුකම් (කල්බදු/ ණය) මගින් ලබාගත් බස් රථයක් ද යන වග : ඔව්/ නැත
(අ) ඔව් නම්, ආයතනයේ නම : ..............................
(ආ) මුදල් ප්‍රමාණය : ..............................
(ඇ) ගෙවිය යුතු වාරික ගණන : ..............................

(16) බස් රථයේ සේවක කණ්ඩායම :
(අ) ස්ථිර රියදුරුගේ නම : ..............................
(ආ) ස්ථිර රියදුරුගේ ලියාපදිංචි අංකය : ..............................
(ඇ) ස්ථිර රියදුරුගේ ජා.ග.කො. හැඳුනුම්පත් අංකය : ..............................
(ඈ) වලංගු කාල සීමාව : ..............................
(ඉ) අතිරේක රියදුරුගේ නම : ..............................
(ඊ) අතිරේක රියදුරුගේ ලියාපදිංචි අංකය : ..............................
(උ) අතිරේක රියදුරුගේ ජා.ග.කො. හැඳුනුම්පත් අංකය : ..............................
(ඌ) වලංගු කාල සීමාව : ..............................
(එ) කොන්දොස්තරවරයාගේ නම : ..............................
(ඒ) කොන්දොස්තරවරයාගේ ලියාපදිංචි අංකය : ..............................
(ඔ) කොන්දොස්තරවරයාගේ ජා.ග.කො. හැඳුනුම්පත් අංකය : ..............................
(ඕ) වලංගු කාල සීමාව : ..............................

(17) ඉල්ලුම් කරන ලද ධාවන මාර්ගය :
(අ) ධාවන මාර්ග අංකය : ..............................
(ආ) .............................. සිට .............................. දක්වා
(ඇ) බස් රථය ගමන ආරම්භ කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................
(ඈ) බස් රථය ගමන ආරම්භ කරනු ලබන පොලිස් බල ප්‍රදේශය : ..............................
(ඉ) බස් රථයේ ගමනාන්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය : ..............................
(ඊ) බස් රථයේ ගමනාන්ත පොලිස් බල ප්‍රදේශය : ..............................
(උ) ධාවන මාර්ගයේ ප්‍රධාන නැවතුම් ස්ථාන : ..............................
(ඌ) විවේක ගැනීම සඳහා බස් රථය නවත්වනු ලබන ස්ථාන : ..............................
(එ) ගමන් වාරයේ මුළු දුර (කි.මී.) : ..............................

(ඒ) දෛනික ගමන්වාර ගණන : ..........................................................................................

(ඔ) වාහන ගාල් කිරීමේ ස්ථානයේ සිට ගමනාන්තයට ඇති දුර : ....................................................

**පැවරුම්ලාභියාගේ වත්කම්වල විස්තර**

11. (1) වාර්ෂික ආදායම : ..........................................................................................................

(2) (අ) පැවරුම්ලාභියා විසින් මේ වන විට කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද මගී සේවා අවසර පත්‍රයක් දරනු ලබන්නේ ද? ඔව්/ නැත: ..........................................................................................

(ආ) පිළිතුර ඔව් නම්, පැවරුම්ලාභියා විසින් කොපමණ කාලයක් අඛණ්ඩ අන්තර් පළාත් බස් රථ සේවාව සැපයීමේ නිරතව සිටී ද? ..........................................................................................

(3) ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින් පැවරුම්ලාභියා බංකොලොත් බවට ප්‍රකාශ කරනු ලබන්නේ ද? ඔව්/ නැත

(4) පැවරුම්ලාභියාගේ බැංකු ගිණුම් විස්තර* :

| *බැංකුව* | *ගිණුම් අංකය* | *මාසය සහ වර්ෂය ශේෂය (රු.)* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

* පැවරුම්ලාභියා විසින් ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමට පෙරාතුව ම වූ මාස හයක කාල සීමාව ආවරණය කරමින් රුපියල් මිලියන දෙකක ශේෂයක් පවත්වා ගනිමින් සිටින බවට ඔහු විසින් තහවුරු කළ යුතු අතර මෙය බැංකු ප්‍රකාශයක් මගින් තහවුරු කළ යුතු ය.

(5) පැවරුම්ලාභියා සමාගමක් වන්නේ නම්, සමාගමේ තක්සේරු කරන ලද වත්කම් මුදලින් (රු.)

..........................................................................................................................

(පැවරුම්ලාභියා විසින් මෙය තහවුරු කිරීම සඳහා සමාගමේ වාර්ෂික ශේෂ පත්‍රය අමුණනු ලැබිය යුතු ය.)

## II වන කොටස

........................................................................ වන මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සහ මේ සමඟ අමුණා ඇති ලේඛන මාගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය හා නිවැරදි වන බවට මෙයින් සහතික කරනු ලබන අතර, ඉහත සපයන ලද තොරතුරු සහ මේ සමඟ ඉදිරිපත් කර ඇති ලේඛන පිළිවෙලින් අසත්‍ය හෝ ව්‍යාජ බවට හෙළිදරව් වුවහොත් හෝ මා විසින් පනතේ හෝ මේ නියෝගවල විධිවිධානවලට හෝ මේ අවසර පත්‍රයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකළහොත් මගී සේවා අවසර පත්‍රය අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට හැකි බව ද, එකී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම හෝ අනනුකූලව කටයුතු කිරීම, පනතේ 28 වන වගන්තිය යටතේ වරදක් වන බව ද මම හොඳින් දනිමි. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කලින් කලට සකස් කර ක්‍රියාත්මක කරනු ලබන කාල සටහන්, ධාවන මාර්ග, ගමන්වාර සහ සේවා වාර ලේඛන සහ පනවනු ලබන නියම සහ කොන්දේසිවලට අනුකූලව මා විසින් මගී ප්‍රවාහන සේවා සැපයිය යුතු බව ද මම වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

| | | |
|---|---|---|
| ............................................ | | ............................................ |
| දිනය | පැවරුම්කරුගේ වම් මහපට ඇඟිලි සලකුණ | පැවරුම්කරුගේ අත්සන |

**III වන කොටස**

......................................................................... (සමාගමේ නම) නාමය දරන සමාගම වන අප විසින් ඉහත සපයා ඇති තොරතුරු සහ මේ සමහ අමුණා ඇති ලේඛන අපගේ දැනුමේ ප්‍රමාණයට සත්‍ය හා නිවැරදි වන බවට මෙයින් සහතික කරනු ලබන අතර, ඉහත සපයන ලද තොරතුරු සහ මේ සමග අමුණා ඇති ලේඛන පිළිවෙලින් අසත්‍ය හෝ ව්‍යාජ බවට හෙළිදරව් වුවහොත් හෝ අප විසින් පනතේ හෝ මේ නියෝගවල විධිවිධානවලට හෝ මේ අවසර පත්‍රයේ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකළහොත් මගී සේවා අවසර පත්‍රය අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ අහෝසි කිරීමට හැකි බව ද, එකී අසත්‍ය තොරතුරු හෝ ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම හෝ අනනුකූලව කටයුතු කිරීම, පනතේ 28 වන වගන්තිය යටතේ වරදක් වන බව ද අපි හොඳින් දනිමු. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කලින් කලට සකස් කර ක්‍රියාත්මක කරනු ලබන කාල සටහන්, ධාවන මාර්ග, ගමන්වාර සහ සේවා වාර ලේඛන සහ පනවනු ලබන නියම සහ කොන්දේසිවලට අනුකූලව අප විසින් මගී ප්‍රවාහන සේවා සැපයිය යුතු බව ද අපි වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමු.

(1) සමාගමේ බලයලත් නිලධරයා

1. නම : ..........................................................................................................
2. තනතුර :.......................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................
4. අත්සන: ...................................................................................................

(2) සමාගමේ බලයලත් නිලධරයා

1. නම : ..........................................................................................................
2. තනතුර :.......................................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය: ..........................................................................
4. අත්සන: ...................................................................................................

.....................................................          .....................................................
දිනය          සමාගමේ නිල මුද්‍රාව

*සාක්ෂිකරුවන්:* (1) සම්පූර්ණ නම: .............................................................................
ලිපිනය:.......................................................................................................
අත්සන:.......................................................................................................
දිනය:.........................................................................................................

(2) සම්පූර්ණ නම: .............................................................................
ලිපිනය:.......................................................................................................
අත්සන:.......................................................................................................
දිනය:.........................................................................................................

<u>දිවුරුම් කොමසාරිස්වරයාගේ තොරතුරු</u>

1. සම්පූර්ණ නම: ......................................................................................................
2. ලිපිනය: ..............................................................................................................
3. දුරකථන අංකය: ....................................................................................................
4. විද්‍යුත් තැපැල් ලිපිනය: .........................................................................................

ඉහත නම් සඳහන් පැවරුම්ලාභියා ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ අත්සන/අත්සන් සහ වම් මහපට ඇඟිලි සලකුණ සහ සමාගමක් වන අවස්ථාවක දී අත්සන සහ නිල මුද්‍රාව වර්ෂ .......................... ක් වූ .................................. මස ..................... වන දින, ඉහත සඳහන් සාක්ෂිකරුවන් සහ මා ඉදිරිපිට දී තබන ලදී.

.........................................................
දිවුරුම් කොමසාරිස්

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

18 වන, 24 වන සහ 28 වන වගන්ති ප්‍රකාර පැවරුම්ලාභියාගේ යෝග්‍යතාවය සළකා බැලීමෙන් පසුව, මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කිරීමට/ නොකිරීමට මෙයින් තීරණය කරනු ලැබේ.

.............................................................
සභාපති
ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## V වන උපලේඛන

**[3 වන නියෝගය ]**

**පැවරුම්ලාභියා විසින් මගී සේවා අවසර පත්‍රයක් පැවරීම සඳහා වන ඉල්ලුම්පතට අමුණා තිබිය යුතු ලේඛන**

| *පැවරුම්ලාභියා පුද්ගලයෙකු වන අවස්ථාවක දී, පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්ලාභියා සමාගමක් වන අවස්ථාවක දී, අපේක්ෂිත පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්කරු මියගිය හෝ ඥාතීත්වය/ සම්බන්ධතාවය මත පැවරීම බලාත්මක කරනු ලබන අවස්ථාවක දී, පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* |
|---|---|---|
| 1. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පත (ඡායා පිටපතක් සමග) | 1. සමාගමේ බලයලත් නිලධරයන් දෙදෙනාගේ ජාතික හැඳුනුම්පතක් | 1. පැවරුම්ලාභියාගේ ජාතික හැඳුනුම්පත (ඡායා පිටපතක් සමග) |
| 2. පැවරුම්ලාභියාගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් | 2. සමාගමේ බලයලත් නිලධරයන් දෙදෙනාගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් (එක් අයෙකුට එක බැගින්) | 2. මියගිය පැවරුම්කරුගේ ජාතික හැඳුනුම්පතේ ඡායාරූපය අපැහැදිලි නම්, මියගිය පැවරුම්කරුගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් |
| 3. පැවරුම්ලාභියාගේ උප්පැන්න සහතිකය (ඡායා පිටපතක් සමග) | 3. සමාගමේ සංස්ථාගත කිරීමේ සහතිකය (ඡායා පිටපතක් සමග) | 3. මියගිය පැවරුම්කරුගේ මරණ සහතිකයේ සහතික පිටපතක් |
| 4. පැවරුම්ලාභියාගේ විවාහ සහතිකය (ඡායා පිටපතක් සමග) | 4. සංගාමික ව්‍යවස්ථාවලිය | 4. මියගිය පැවරුම්කරු සමඟ පැවති ඥාතීත්වය/සම්බන්ධතාවය තහවුරු කරන ලේඛනවල සහතික පිටපත් (උප්පැන්න සහතිකය, විවාහ සහතික ආදිය) |
| 5. ඉල්ලුම්පත ඉදිරිපත් කිරීමට පෙරාතුව ම වූ මාස හයක කාල සීමාව ආවරණය කරන බැංකු ප්‍රකාශවල සහතික පිටපත් | 5. සුදුසුකම් ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සමාගමේ වාර්ෂික ශේෂ පත්‍රයේ සහතික පිටපත | |

| *පැවරුම්ලාභියා පුද්ගලයෙකු වන අවස්ථාවක දී, පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්ලාභියා සමාගමක් වන අවස්ථාවක දී, අපේක්ෂිත පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* | *පැවරුම්කරු මියගිය හෝ ඥාතීත්වය/ සම්බන්ධතාවය මත පැවරීම බලාත්මක කරනු ලබන අවස්ථාවක දී, පැවරුම්ලාභියා විසින් ඉදිරිපත් කළ යුතු ලේඛන* |
|---|---|---|
| | | 5. පැවරුම්කරු සමග ඇති ඥාතීත්වය/ සම්බන්ධතාවය තහවුරු කිරීමට දිවුරුම් ප්‍රකාශයක්. |
| | 6. පැවරුම්ලාභියා වීම සඳහා කැමැත්ත ප්‍රකාශ කරනු ලබන සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය | 6. පැවරීම බලාත්මක කිරීමට විධානය කරනු ලබන නඩු තීන්දුවේ සහතික පිටපතක් සහ අධිකරණය විසින් ප්‍රදානය කරන ලද ප්‍රොබේට් බලපත්‍රය හෝ අද්මිනිස්ත්‍රාසි බලපත්‍රය. |
| 6. පැවරුම්ලාභියා වෙත නිකුත් කරන ලද පොලිස් නිශ්කාෂණ වාර්තාව | | 7. පැවරුම්ලාභියා වෙත නිකුත් කරන ලද පොලිස් නිශ්කාෂණ වාර්තාව |
| 7. පැවරුම්ලාභියා වෙත නිකුත් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය | | 8. පැවරුම්ලාභියා වෙත නිකුත් කරන ලද ග්‍රාම නිලධාරි සහතිකය |
| 8. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) | 7. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) | 9. සාක්ෂිකරුවන්ගේ ජාතික හැඳුනුම්පත් (එක් එක් සාක්ෂිකරුට පිටපත බැගින්) |
| | | 10. කලත්‍රයා, දෙමව්පියකු හෝ වයස අවුරුදු දහ අට සම්පූර්ණ කරන ලද දරුවකු හෝ සහෝදරයෙකු, පැවරුම්ලාභියා වන අවස්ථාවක දී, ඉහත නිශ්චිතව දක්වා ඇති ලේඛනවලට අමතරව, පහත දැක්වෙන ලේඛන අදාළ පරිදි ඉදිරිපත් කළ යුතු ය :-<br><br>(අ) මියගිය පැවරුම්කරුගේ උප්පැන්න සහතිකයේ සහතික පිටපතක්;<br><br>(ආ) මියගිය පැවරුම්කරුගේ විවාහ සහතිකයේ සහතික පිටපතක්;<br><br>(ඇ) මියගිය පැවරුම්කරුගේ කලත්‍රයාගේ උප්පැන්න සහතිකයේ සහතික පිටපතක්;<br><br>(ඈ) මියගිය පැවරුම්කරුගේ අදාළ දරුවාගේ උප්පැන්න සහතිකයේ සහතික පිටපතක්;<br><br>(ඉ) මියගිය පැවරුම්කරුගේ අදාළ දෙමව්පියාගේ උප්පැන්න සහතිකයේ සහතික පිටපතක්;<br><br>(ඊ) මියගිය පැවරුම්කරුගේ අදාළ සහෝදරයාගේ උප්පැන්න සහතිකයේ සහතික පිටපතක්. |

* ඉහත සඳහන් ලේඛනවලට අමතරව, බස් රථය සහ එහි සේවක කණ්ඩායම සම්බන්ධයෙන් වන පහත ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය:-

1. බස් රථය ලියාපදිංචි කිරීමේ සහතිකය,
2. රක්ෂණ සහතිකය,
3. වාහනයේ යෝග්‍යතා සහතිකය,
4. අදාළ වර්ෂය සඳහා වන ආදායම් බලපත්‍රය සහ වායු විමෝචන සහතිකය,
5. අදාළ බස් රථයේ පරීක්ෂණ වාර්තාව,
6. ස්ථිර රියදුරුගේ ජා.ග.කො. හැඳුනුම්පත (ඡායා පිටපතක් සමඟ),
7. අතිරේක රියදුරුගේ ජා.ග.කො. හැඳුනුම්පත (ඡායා පිටපතක් සමඟ),
8. කොන්දොස්තරවරයාගේ ජා.ග.කො. හැඳුනුම්පත (ඡායා පිටපතක් සමඟ),
9. මේ උපලේඛනයේ ඇමුණුමේ දක්වා ඇති ආකෘතියට සාරානුකූල වූ දිවුරුම් ප්‍රකාශයක්.

**V වන උපලේඛනයේ ඇමුණුම**

**දිවුරුම් ප්‍රකාශය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ........................................................................................ ලිපිනයේ පදිංචි ජාතික හැඳුනුම්පත් (ජා.හැ.) අංක .................................................... දරන ........................................................ .......................... (සම්පූර්ණ නම) වන මම/ .................................... නාමය දරන සමාගම වන අපි, ........................................... (බෞද්ධ/හින්දු/ඉස්ලාම්/ක්‍රිස්තියානි) ආගමිකයකු/ලබ්ධිකයකු වශයෙන් ගම්භීර පූර්වකව ද, අවංකව ද හා සත්‍ය ලෙස ද පහත දැක්වෙන පරිදි මෙයින් ........................................................ (දිවුරුම් දී/ප්‍රකාශ කර) ප්‍රතිඥා දෙමි/දෙමු.

1. මම/අපි ඉහත නම් සඳහන් ප්‍රකාශක/ප්‍රකාශකයන් වෙමි/වෙමු.

2. කොමිෂන් සභාව විසින් මා/අප වෙත මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කිරීමෙන් අනතුරුව, එකී මගී සේවා අවසර පත්‍රයේ නියම සහ කොන්දේසිවලට සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් කලින් කලට සකස් කරනු ලබන ගමන්වාර සහ කාල සටහන්වලට අනුකූලව, නිශ්චිතව දක්වා ඇති ධාවන මාර්ගයේ පමණක් .............................................. (බස් රථයේ ලියාපදිංචි අංකය) ධාවනය කිරීමට අප බැඳී සිටින බව මම/අපි මෙයින් ............................................... (දිවුරුම් දී/ප්‍රකාශ කර) සිටිමි/සිටිමු.

3. ඉහත සඳහන් බස් රථය ධාවනය කිරීම සඳහා අඛණ්ඩ මූල්‍ය ශක්‍යතාව මට/ අප සතු වන බව මෙයින් ...................... ............... (දිවුරුම් දී/ප්‍රකාශ කර) සිටිමි/සිටිමු.

4. ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කරන ලද දිනයේ සිට අවම වශයෙන් වසර දෙකක කාලසීමාවන් ඉකුත් වන තෙක් එකී මගී සේවා අවසර පත්‍රය වෙනත් තැනැත්තකු හෝ අස්තිත්වයක් වෙත පැවරීමට මට/අපට කිසිදු අයිතියක් නොමැති බව මම/අපි මෙයින් .................................................. (දිවුරුම් දී/ප්‍රකාශ කර) සිටිමි/සිටිමු.

5. මා/අප විසින් ඉල්ලුම්පත සමඟ යම් ව්‍යාජ ලේඛනයක් හෝ අසත්‍ය තොරතුරක් ඉදිරිපත් කර නොමැති බව මම/අපි මෙයින් ........................................ (දිවුරුම් දී/ප්‍රකාශ කර) සිටිමි/සිටිමු.

6. මගී සේවා අවසර පත්‍රය පැවරීම සහ මගී සේවා අවසර පත්‍රය ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ යම් තීරණයක් මා/අප විසින් පිළිගනු ලබන බව මම/අපි මෙයින් .................................................... (දිවුරුම් දී/ප්‍රකාශ කර) සිටිමි/සිටිමු.

| | |
|---|---|
| ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය, ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක/ප්‍රකාශකයන් වෙත නිසි පරිදි කියවා තේරුම් කරදීමෙන් අනතුරුව, ඔහු/ඇය/ඔවුන් විසින් එහි අන්තර්ගතය තේරුම්ගෙන ප්‍රතිඥා දී මා ඉදිරිපිට දී වර්ෂ ............ ක් වූ ................ මස ............... වන දින ...................... දී ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ අත්සන තබන ලදී. | (අත්සන සහ සමාගමේ නිල මුද්‍රාව) |

දිවුරුම් ප්‍රකාශක

මා ඉදිරිපිට දී ය

...........................................
දිවුරුම් කොමසාරිස්

EOG 01 - 0714

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.